// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1851/19 - 2014 පෙබරවාරි මස 25 වැනි අඟහරුවාදා - 2014.02.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ශ්‍රී ලංකා මහ බැංකුවේ නිවේදන

### 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත

2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 4(1) සහ 6 වැනි වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 35 වැනි වගන්තිය යටතේ ජනාධිපති සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය විසින් සාදන ලද රෙගුලාසිය වේ.

මහින්ද රාජපක්ෂ
ජනාධිපති සහ මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය

වර්ෂ 2014 ක් වූ පෙබරවාරි මස 11 වැනි දින
කොළඹ

2014 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි

1. මෙම රෙගුලාසි 2014 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම සහ වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි යනුවෙන් හඳුන්වන අතර, මෙම රෙගුලාසි වහාම බලපවත්වන පරිදි ක්‍රියාත්මක විය යුතුය. හැඳින්වීම

2. 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ (පනත) 3(ඇ) වගන්තිය යටතේ බලපත්‍රය ලබාගැනීම සඳහා අයදුම්කරන පොදු සමාගමක පැවතිය යුතු අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය පහත පරිදි විය යුතුය. බලපත්‍රය ලබා ගැනීම සඳහා අයදුම්කරන පොදු සමාගමක තිබිය යුතු අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය

| *අවම නිකුත් කළ හා ගෙවා නිමි ප්‍රාග්ධනය (රු. මිලියන)* | *බලපවත්වන දිනය* |
|---|---|
| 250 | 2014.01.01 දින සිට |
| 300 | 2015.01.01 දින සිට |

කෙසේ වුවද, නිකුත් කළ සාමාන්‍ය කොටස් සහ නිකුත් කළ අසම්මුච්ත, ගෙවා නිදහස් කල නොහැකි වරණීය කොටස් ගෙවා නිමි කොටස් ලෙස සැලකිය යුතු වනුයේ එම කොටස් මුදල් ප්‍රතිශ්ඨාවන් මත නිකුත් කර ඇත්නම් පමණි.

1A - G 19123 — 80 (2014/02)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලියාපදිංචි වීමේ අයදුම්පත් ගාස්තු

3. පනතේ 4(1) (ඊ) වගන්තිය සඳහා, ලියාපදිංචි කිරීමේ අයදුම්පත් ගාස්තුව රු.100,000/- විය යුතුය.

ලියාපදිංචි කිරීමේ ගාස්තු

4. පනතේ 3 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වීම සඳහා අදාළ වන ලියාපදිංචි ගාස්තුව (ලියාපදිංචි කරන ලිත් වර්ෂය සඳහා) රු.500,000/- විය යුතුය. මෙම ගාස්තුව ලියාපදිංචි කරන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය.

වාර්ෂික බලපත්‍ර ගාස්තු

5. පනතේ 6 වැනි වගන්තියෙහි දැක්වෙන අරමුණ සඳහා, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 3 වැනි වගන්තිය යටතේ ලියාපදිංචි වී ඇති සෑම කල්බදු මූල්‍යකරණ ආයතනයක්ම 2014 වර්ෂය සහ ඊට පසු එළඹෙන සෑම වර්ෂයක් සඳහාම අදාළ වන වාර්ෂික බලපත්‍ර ගාස්තුව, ආයතනයේ මුළු වත්කම් ප්‍රමාණය පදනම් කරගෙන පහත සඳහන් පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවට ගෙවිය යුතුය.

| *ලිත් වර්ෂය අවසානයට ආයතනයේ මුළු වත්කම් ප්‍රමාණය* | *වාර්ෂික බලපත්‍ර ගාස්තුව (රු.)* |
|---|---|
| රුපියල් බිලියන 1 හෝ ඊට අඩු | 250,000/- |
| රුපියල් බිලියන 1 ට වැඩි නමුත් රුපියල් බිලියන 10 කට අඩු හෝ සමාන | 500,000/- |
| රුපියල් බිලියන 10 ට වැඩි | 1,000,000/- |

2010 අංක 1 දරන රෙගුලාසි අවලංගු කිරීම

6. 2010 අංක 1 දරන කල්බදු මූල්‍යකරණ (ලියාපදිංචි කිරීම හා වාර්ෂික බලපත්‍ර ගාස්තු) රෙගුලාසි මෙයින් අවලංගු වේ.

03 - 300

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.